# ඓතිහාසික විජයග්‍රහණය

අපේ වීරෝදාර හමුදාවන් විජාතික බලවේගවලට එරෙහිව කරන ලද මෙහෙයුම්වලින් ඓතිහාසික විජයග්‍රහණයක් ලබා ඇත. කාලිංග මාඝ පරාජය කිරීමෙන් පසුව ලත් විශිෂ්ට ම ජයග්‍රහණය ලෙස ඒ හැඳින්විය හැකි ය. එහෙත් ඒ සංසන්දනය කරන විට මාඝ පොළොන්නරුව යම් කාල පරිච්ඡේදයක දී යටත් කරගෙන සිටි බවත් ප්‍රභාකරන් කිසි විටෙක ලංකාවේ කිසිදු ප්‍රදේශයක් නිල වශයෙන් පාලනය නොකළ බවත් සිහි තබාගත යුතු ය. ප්‍රභාකරන් දිවයිනේ ඇතැම් ප්‍රදේශයක බැංකු පොලිසි පවත්වාගෙන බව සැබෑ ය. එහෙත් පසුගිය දා පාර්ලිමේන්තුවේ දී ජනාධිපතිතුමා ප්‍රකාශ කළ පරිදි ඔහු පාර්ලිමේන්තුවක් පවත්වාගෙන නො ගියේ ය. එපමණක් නොව ඒ ප්‍රදේශවල රජයේ සේවකයන්ට වැටුප් ගෙවුවේ ආණ්ඩුව ය. පාසල්, රෝහල්, විශ්වවිද්‍යාල පවත්වාගෙන ගියේ ආණ්ඩුව ය. මාඝ පොළොන්නරුව පාලනය කළ ආකාරයෙන් කිලිනොච්චිය පාලනය කිරීමට ප්‍රභාකරන්ට නො හැකිවිය.

කොටි සංවිධානය තනිව ගතහොත් එතරම් ශක්තිමත් සංවිධානයක් නොවන බව ද මෙහෙයුම්වල දී පැහැදිලි විය. ප්‍රභාකරන් හා කොටි ඉහළට ඔසවා තබනු ලැබුයේ ඔවුන් යුද්ධයෙහි අති දක්‍ෂයන් බව ප්‍රචාරය කරනු ලැබුයේ, ඔවුන් අනභිබවනීය බව කියන ලද්දේ බටහිර ඊනියා යුද්ධ විශේෂඥයන් හා ලංකාවේ ඔවුන්ගේ ඇම්බැට්ටයන් විසිනි. මේ ඇම්බැට්ටයන්ට තමන්ගේ මතයක් නැති බවත්, ඔවුන් නිර්මාණශීලී නොවන බවත්, ඔවුන් තම ස්වාමිවරුන්ගේ රාවය පමණක් බවත් මතක තබාගත යුතු ය. කොටින් පුම්බනු ලැබුයේ බටහිර හා මෙරට ජඩ පත්තර විසින් ද බැවින් ඔවුහු විචිධාර්ථවලින් කඩදාසි කොටි වූහ. එහෙත් මේ එකකින්වත් අපේ රණවිරුවන් ලත් ජයග්‍රහණය අවතක්සේරු නො වේ. අප රණවිරුන් සටන් කෙළේ බ්‍රිතාන්‍යීන් ප්‍රමුඛ බටහිරයන් සමග ය. කොටි යනු බ්‍රිතාන්‍යීන්ගේ බළල් අතක් පමණක් විය. කොටි ද බළල් පවුලට අයත් බව ද මෙහි දී සිහිවෙයි.

සිංහලයන් ඉතිහාසයේ කිසිම දිනෙක කිසිම ජාතියකට මුළුමනින් ම යටත් වී නැත. ඇතැම් කාලවල ඇතැම් ප්‍රදේශ සුළු කාලයකට විජාතික බලවේග විසින් පාලනය කරනු ලැබූ නමුත් යුද්ධයෙහි අති දක්‍ෂයන් වූ සිංහලයෝ වැඩිකල් නොහොත් ම විජාතික බලවේගය පරාජය කිරීමට සමත් වූහ. අප ඉංගිරිසින්ට යටත් නොවූ බවත් ඩොයිලිගේ සටකපටවලට හසු වී ගිවිසුමකින් ඉංගිරිසින්ට රට භාර දුන් බවත් මතක් කර ගත යුතු ය. අද සිදු වී ඇත්තේ ද ඒ යුද්ධයෙහි අති දක්‍ෂ සිංහලයන් අතින් බ්‍රිතාන්‍යය පරාජය වීම ය. ප්‍රභාකරන් හා කොටි යනු බ්‍රිතාන්‍යීන්ගේ ඉත්තෝ පමණක් වූහ. අර ඇම්බැට්ටයෝ ද බ්‍රිතාන්‍යීන්ගේ ඉත්තෝ වෙති. කොටින්ට ආයුධ සපයන ලද්දේ බ්‍රිතාන්‍යීන් ප්‍රමුඛ ඇතැම් බටහිර රටවල් විසිනි. අපේ හමුදාවලට ද නැති සබ්මැරීන, නවීන බර ආයුධ කොටින් ලබාගත්තේ පද්මනාදන් ඔස්සේ විය හැකි ය. එහෙත් පද්මනාදන් සමඟ සම්බන්ධකම් පැවැත්වූ බටහිර නිලධාරීහු කවරහු ද? බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළෙහි වැසිකිළිය තුළට වැදී ඔහුට දුරකථනයෙන් කතාකළ නම්බියාර් නම් එක්සත් ජාතීන්ගේ සංවිධානයෙහි නිලධාරියා එක් අයකු පමණකි. පද්මනාදන් නම්බියාර්ට කියා ඇත්තේ එක්සත් ජාතීන්ගේ හමුදා ලංකාවට ගෙන ඒමටත් කොටි නායකයන් බේරාගැනීමටත් කටයුතු කරන ලෙස ය. මිලිලීටරයක් ප්‍රමාණයට කුඩා වී ඇති මිලිබෑන්ඩ් ද එක්සත් ජාතින්ගේ හමුදා ලංකාවට එවීමට උත්සාහ කෙළේ ය. චීනය හා රුසියාව වැනි මිත්‍ර රටවල් නොවන්නට එක්සත් ජාතීන්ගේ හමුදා ප්‍රභාකරන් පැහැර ගෙන ගොස් මුහුදින් එතෙර ඊළමක් පිහිටුවීමට තිබුණි. එහෙත් ඒ සියල්ල ආණ්ඩුවේ නිවැරදි විදේශීය ප්‍රතිපත්තිය නිසා වැළකී ගියා පමණක් නොව විශේෂයෙන් ම නෝර්වේ ඔස්සේ පැමිණි බ්‍රිතාන්‍ය උපදෙස් සහිතව කරන ලද කොටි සටනින් පරාජය කිරීමට අපේ රණවිරුවෝ සමත්වූහ. ආපසු හැරී බලන විට රජිව් ගාන්ධි ඝාතනය ද කාගේ වුවමනාවට කරන ලද්දක් දැයි සෙවිය යුතු වෙයි.

පැහැදිලිව ම අපට සටන්කිරීමට සිදුවූයේ බ්‍රිතාන්‍යය සමග ය. මෙරට දෙමළ ජාතිවාදය ලන්දේසීන්ගේ නිර්මාණයක් වුව ද ඒ පෝෂණය කර හදාවඩනු ලැබුයේ බ්‍රිතාන්‍යීන් විසිනි. ඒ සිංහල බෞද්ධ සංස්කෘතියට එරෙහිව ය. ලංකාවට එරෙහිව ඊනියා ජාත්‍යන්තර මතයක් ඇතිකිරීම සඳහා බ්‍රිතාන්‍යීහු තම රටෙහි විසිරී සිටින කොටි හිතවාදී දෙමළ ජාතිවාදී දෙමළ බෙදුම්වාදී දෙමළ ජනයාට ලංකා, ඉන්දියා, චීන තානාපති කාර්යාලවලට පහරදීමට ඉඩදුන්හ. තේම්ස් ගඟ හරහා වැටී ඇති පාලමක් වසා දැමීමට එරෙහිව කිසිවක් නො කළහ. දෙමළ ජාතිවාදීහු පන්සල්වලට පහරදුන්හ. ඔවුහු බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව ඉදිරිපිට දින ගණනක් තිස්සේ පිකට්ටු පවත්වති. දෙමළ ජාතිවාදීන්ට එරෙහිව ක්‍රියා නොකර සිටීමට බැරි තත්වයකට අද ලන්ඩනයේ පොලීසිය පත්වී ඇත. එසේ වුවත් දෙමළ ජාතිවාදීහු අද ලන්ඩනයේ,

© Prof. Nalin De Silva

විශේෂයෙන් ම වෙම්බිලි ප්‍රදේශයේ වෙසෙන සිංහලයන්ට තර්ජනය කරති. අද එහි සිංහලයෝ බියෙන් වාසය කරති. බ්‍රිතාන්‍ය දෙමළ ජාතිවාදීන්ට රිසිසේ කටයුතුකිරීමට ඉඩ දී ඇත. දෙමළ ත්‍රස්තවාදයේ අවසානය දක්වාම බ්‍රිතාන්‍ය විදේශ ඇමති ඩේවිඩ් මිලිබෑන්ඩ් උත්සාහ කෙළේ ලංකාවට විදේශීය හමුදා එවීමට ය. එංගලන්තයේ විසූ වාමාංශිකයකු වූ ද ග්‍රන්ථ කර්තෘවරයකු වූ ද රැල්ෆ් මිලිබෑන්ඩ්ගේ පුතකු වූ ඩේවිඩ් ඉංගිරිසිකාරයකුට අමතරව වාමාංශිකයකු ලෙස ද සිංහල බෞද්ධයන්ට විරුද්ධ වෙයි. මෙරට සිටින කසිකබල් මාක්ස්වාදීන්, පශ්චාත්නූතනවාදීන්, පශ්චාත්මාක්ස්වාදීන් ද මිලිබෑන්ඩ්ලාගේ පොත් කියවා නන්නත්තාර වී සිංහල බෞද්ධ විරෝධීන්ව සිටිනු දැකගත හැකි ය. කතෝලික චින්තනය මත පදනම් වූ මාක්ස්වාදය සිංහල බෞද්ධ විරෝධී වීම පුදුමයක් නො වෙයි.

බටහිරයෝ මේ ආණ්ඩුවට දෙමළ ත්‍රස්තවාදයට එරෙහිව ක්‍රියා නොකිරීමට විවිධ බලපෑම් කළහ. ආධාර හෙවත් ණය නොදීමේ සිට යුද්ධ අපරාධකරුවන් ලෙස ජනාධිපති, ආරක්ෂක ලේකම්, හමුදාපතිවරුන් හා වෙනත් අයට විරුද්ධව නඩු පැවරීම දක්වා ඒ බලපෑම් විය. අද ද යුද්ධ අපරාධකරුවන් ලෙස සැලකීමේ තර්ජනය පවතියි. ඒ සම්බන්ධ නඩු පවරන්නේ බටහිරයන්ගේ ම උසාවිවල බැවින් එහි තීරණ කවරේදැයි  කල්තබා ම කිවහැකි ය. මේ පිළිබඳ ව අපි මාස දෙකකට පමණ ඉහත දී ද සාකච්ඡා කෙළෙමු. මහින්ද රාජපක්ෂ මහතා හා ආණ්ඩුව මේ සියළු බලපෑම්, තර්ජන, ගර්ජන හමුවේ ඉන්ද්‍රඛීලයක් සේ නොසැලී සිටියේ ය. දෙමළ ත්‍රස්තවාදය පරාජයකිරීමට තිබූ එකම ක්‍රමය වූයේ බ්‍රිතාන්‍යයේ හා බටහිර අණට, බසට කන් නො දීම ය. එසේ බටහිරට නොනැමී සිටීමෙන් දෙමළ ත්‍රස්තවාදය පරාජය කළ හැකි බව අපි දැන සිටියෙමු. අවසානයේ දී මහින්ද රාජපක්ෂ මහතා ඉටු කෙළේ ඒ කරුණ ය. හමුදාවට දේශපාලන නායකත්වය දීමේ දී මේ කරුණ ඉතා වැදගත් විය. ඒ මහතාගේ බටහිරට නොනැමෙන විදේශ ප්‍රතිපත්තිය හේතුකොටගෙන චීනය රුසියාව පමණක් නොව ඉන්දියාව ද ලංකාවට පක්ෂපාතී වන ප්‍රතිපත්තියක් අනුගමනය කෙළේ ය. ඉන්දියාව අද එයි හෙට එයි යනුවෙන් කෑ ගැසූ ජ වි පෙරමුණට මේ කරුණ ද අවබෝධ කරගැනීමට නොහැකිවිය. ඉන්දියාව මේ සියල්ල කෙළේ එරට මැතිවරණ සමයක වීම මෙහි වැදගත්කම දෙගුණ තෙගුණ කරයි. දෙමළ ත්‍රස්තවාදය පරාජය කෙළේ කවුද යන ප්‍රශ්නයට ඇත්තේ එක ම එක පිළිතුරක් පමණකි. ඒ මහින්ද රාජපක්ෂ ය. මා ඒ බව කියන්නේ කිසිදු තනතුරක් හෝ නම්බු නාමයක් හෝ සම්මානයක් හෝ බලාපොරොත්තුවෙන් නො වේ. එවැන්නක් දුන්නත් මම ඒ ගෞරවයෙන් ප්‍රතික්ෂෙප කරමි. යුද්ධය දිනීම ගැන කතාකරන්නේ  පඬියන් පතුරවන ජනප්‍රියවාදී බාල ජනතාවාදී කතාවලට පිළිතුරක් ලෙස ය. අපේ රණවිරුවන් විශාල කැපකිරීමක් කර ඇති බව සැබෑ ය. ඔවුහු ඒ සඳහා ඇස් ඉස් මස් පමණක් නොව ජීවිත ද පූජා කළහ. ඔවුන්ට ලැබිය යුතු ගෞරවය අබමල් රේණුවකින්වත් අඩුකිරීමට මට අවශ්‍ය නැත. එහෙත් එළාර පරාජය කෙළේ ගැමුණු කුමරු වුවා මෙන් ම රුවන්වැලිසෑය තැනුවේ හැමුණු රජු වුවා මෙන් ම ත්‍රස්තවාදය ද පරාජය කෙළේ මහින්ද රාජපක්ෂ ජනාධිපති ය. බොරු වාමාංශික හා ලිබරල් අදහස්වලින් හිස් අවුල් කරගත්තෝ දාගැබ් වැව් නිර්මාණය කළෝ එකල විසූ ශිල්පීහු නොවේදැයි ප්‍රශ්න කරති. රජවරුන්ගේ එනම් නායකයන්ගේ නමින් ඒ හැඳින්වීම ඔවුහු ප්‍රතික්ෂෙප කරති. එහෙත් මේ පඬියන්ගෙන් තමාගේ නිවස හැදූවේ කවුදැයි ප්‍රශ්න කරන්න. ඔවුන් කියනු ඇත්තේ ඒ තමා හෝ තම පියා හෝ මිස මේසන් බාසුන්නැහෙලා බව නම් නො වේ. මේ පඬියන්ගේ පඬිකතාවලට ජඩමාධ්‍යයෙහි ඉඩ ලැබීම පුදුමයට කරුණක් නො වේ.

ජඩමාධ්‍යයෙන් අපි ජනමාධ්‍යයට හැරෙමු. මේ ඓතිහාසික විජයග්‍රහණයට හේතු වූ තවත් කරුණක් ඇත. ඒ ජනමතය ය. ජනමතය අවසාන කාලයේ දී මුළුමනින් ම මෙන් ආණ්ඩුව සමග විය. බටහිරට නොනැමී සිටීමට ආණ්ඩුවට ජනමතය ශක්තියක් විය. අද හමුදා මෙහෙයුම් නිසා සාමය ඇති වී තිබෙන මොහොතේ තොරතෝංචියක් නැතිව ගිරා පෝතකයන් මෙන් විජයග්‍රහණය ගැන කියවන නිවේදක නිවේදිකාවන්ගේ නාලිකා එදා මෙහෙයුම්වලට පක්ෂ නො වීය. ප්‍රභාකරන් පරාජය කළ නොහැකි පුද්ගලයකු ලෙස හැඳින් වූ මොවුහු සාමය සඳහා ඊනියා සාම සාකච්ඡා හැරෙන්නට වෙනත් කිසිවක් නො දුටුවෝ ය. බෞද්ධයනට යුද්ධ කළ හැකි දැයි ඔවුහු පඬියන් අනුව යමින් ප්‍රශ්න කළහ. මේ ජඩමාධ්‍යවලින් ජාතිවාදී පඬංගුව යන නමින් ගැරහුම් ලබමින්, එඩ්මන්ඩ් රණසිංහ, ගාමිණී සුමනසේකර ආදී මහතුන් ජාතිවාදීන් ලෙස පරිහාසයට පත්වෙමින් ජනමතය වෙනස් කෙළේ දිවයින පුවත්පත ය. අද ජයග්‍රහණයේ උරුමය බදාගැනීමට ජඩමාධ්‍ය පොරකන්නේ දිවයින අමතක කරමිනි. දෙමළ ත්‍රස්තවාදය පරාජය කිරීමේ දී සටන් මෙහෙයුම්, රණකාමීත්වය, දේශපාලන නායකත්වය මෙන් ම මතවාදී ආධිපත්‍යය ද වැදගත් විය. අවුරුදු තිහකට ආසන්න කාලයක් තිස්සේ බටහිර ක්‍රිස්තියානි නූතනත්ව මතවාදය පරාජය කිරීමට දිවයින කළ මෙහෙය අගය කරමු.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva